# රවිරාජ්ගේ මෘතදේහය වෙන්දේසිකිරීම

කොටි සංවිධානයේ බලය පැවරුණු (පෙරකලාසි) නියෝජිතයා වූ දෙමළ ජාතික සංධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී නඩරාජා රවිරාජ් මහතා ඝාතනයකිරීම අපිදු හෙළාදකිමු. කිසිවකු දේශපාලන හෝ දේශපාලන නොවන හෝ හේතුවක් උඩ ඝාතනයකිරීම අනුමත කළහැකි නො වෙයි. එහෙත් ඒ මහතාගේ මෘතදේහය විකිණීමට ඊනියා යුද විරෝධි කණ්ඩයමක් හා තවත් අය පෙළඹුණේ ඔවුන් හුදෙක් ඒ ඝාතනය අනුමත නොකළ නිසා නොවන බව පැහැදිලි ය. මෘතදේහ විකිණීම ද දේශපාලනයට අයත් බව අපි දනිමු. කවුරු රවිරාජ් මහතා මරාදැමුවේ දැයි සොයාබැලීම සඳහා එංගලන්තයේ ස්කොට්ලන්ඩ් ආයතනයේ ද සහාය ලබාගැනීමට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා පොලීසියට උපදෙස් දී ඇත. දෙමළ ජාතිවාදය බෞතීස්ම කළ බ්‍රිතාන්‍යයන්ගෙන් ඒ සඳහා සහාය ලබාගැනීමෙන් ආණ්ඩුව හෝ ආණ්ඩුවට සම්බන්ධ පක්ෂයක් හෝ ඝාතනයට වගකිවයුතු නැති බව පෙන්වාදීම ආණ්ඩුවේ අරමුණ වියහැකි ය. අද ඊනියා යුද විරෝධීන්ගේ වෑයම ඝාතනයට ආණ්ඩුවට සම්බන්ධ අවිගත් කණ්ඩායමක් වගකිව යුතු යැයි පෙන්වාදීම ය. රවිරාජ් මහතා ඝාතනයකරනු ලැබුයේ කවුරුන් විසින් ද? අවසාන කාලයේ දී ඒ මහතාගේ දේශපාලනය ප්‍රශ්නයක් වුයේ කාහට ද? ඔහුගේ දේශපාලනය ආණ්ඩුවට හෝ ආණ්ඩුවට සම්බන්ධ කණ්ඩායමකට හෝ හදිසියේ ප්‍රශ්නයක් වීමට ඉඩක් නැත. රවිරාජ් මහතා කොටින්ට පක්ෂපාතී දේශපාලනයේ යෙදී ඇත්තේ අද ඊයේ නො වෙයි. එහෙත් ඒ මහතා මෑතක දී කරන ලද ප්‍රකාශ කොටි සංවිධානයට ප්‍රශ්නයක් වූවාට සැකයක් නැත. උදාහරණයක් ලෙස පසුගිය ඔක්තෝබර් 14 වැනි දා ඒෂියන් ට්‍රිබියුන් පුවත්පතට කරන ලද ප්‍රකාශයකින් ඔහු කොටි සංවිධානය ළමයින් බළහත්කාරයෙන් ත්‍රස්තවාදී කණ්ඩයමට බඳවාගැනීම විවේචනයට ලක්කර ඇත. එපමණකින් සෑහීමට පත් නොවූ ඒ මහතා ප්‍රභාකරන්ගේ දරුවන් සුඛෝපභෝගී ලෙස එතෙර ජීවත්වීම ගැන ද සඳහන්කර ඇත.

සිංහලයන් අතර ඇති යකා බැඳගත්තා වැනිය යන කියමන මෙහි දී සිහියට නැගෙයි. යකාට අවශ්‍ය දේ ඉටුකිරීමට පියවර නොගතහෝ යකාගෙන් මැරුම්කෑමට වුව ද සිදුවෙයි. රවිරාජ් මහතා අයත් වූයේ කොටි සංවිධානයේ පෙරකලාසි පක්ෂයට ය. එවැන්නකුට කොටින්ට සුළුවෙන් හෝ විරුද්ධ විය නො හැකි ය. ඒ පක්ෂයේ අය කොටි සංවිධානය විවේචනයකිරීම ප්‍රභාකරන්ගේ චිත්තප්‍රීතියට හේතුවන්නේ යැයි තුන්හිතකින්වත් සිතිය නො හැකි ය. ඒ පක්ෂයේ අයකු ප්‍රභාකරන්ගේ දරුවන් එතෙර ඉගෙනීම ගැන දෙමළ ජනයාට මතක්කිරීම ප්‍රභාකරන්ට ඉවසා දරාගත නොහැකි වී ඇති බව පැහැදිලි ය. ඒෂියන් ට්‍රිබියුන් පත්‍රයට ඉහත සඳහන් ආකාරයේ ප්‍රකාශයක් කර මාසයක් ගතවීමට පෙර රවිරාජ් මහතා ඝාතනයකෙරිණි. මේ ඝාතනය කොටින්ගේ තවත් අමානුෂික ඝාතනයක් වීමට ඇති ඉඩකඩ අධික ය. මෙයින් ඉහත දී සිවරාම් හෙවත් තාරකී නම් ජනමාධ්‍යවේදියා ඝාතනයකරනු ලැබූ අවස්ථාවේ දී මෙරට නිදහස් මාධ්‍ය ව්‍යාපාර වශයෙන් පෙනී සිටිම මාධ්‍ය මාෆියාව ඒ ඝාතනයට සිංහලයන් හා සිංහල පක්ෂ වගකිවයුතු බවට චෝදනා කෙළේ ය. එහෙත් වැඩිකල් නොගොස් තාරකී හා කොටි සංවිධානය අතර තිබූ ප්‍රශ්න හෙළිදරවු විය. ඉන්පසු මාෆියාව නිශ්ශබ්ද විය. මේ මාෆියාවලට, ඊනියා යුද විරෝධී කණ්ඩායම්වලට, යන එන මංනැති මාක්ස් ට්‍රොට්ස්කිවාදී කල්ලි කිහිපයකට, බටහිරට අවශ්‍ය ආකාරයට සිංහල බෞද්ධ විරෝධී චිත්‍රපටි හා ටෙලිනාට්‍ය කුලියට නිෂ්පාදනයකරන ඇංකරයන්ට, සිරසක් නැති ජඩමාධ්‍යවලට මෘතදේහයක් යනු දෙවියන්වහන්සේ විසින් එවන ලද ත්‍යාගයක් පමණක් වෙයි. ඔවුන් මෘතදේහය යොදාගන්නේ සිංහලයන්ට හා සිංහලයන්ගේ යැයි කියන ආණ්ඩුවට චෝදනා එල්ලකිරීමට පමණකි. ඒ සඳහා මොවුන්ට සෑහෙන ගෙවීමක් බටහිරයන් විසින් කෙරන බව රහසක් නො වෙයි. මොවුන්ගේ ආදායම් මාර්ග හෙළිදරවුකරන්නේ නම් මේ කරුණ ජනතාවට පැහැදිලිව දැනගතහැකි වනු ඇත.

විහාරමහාදේවී උද්‍යානයට රවිරාජ් මහතාගේ මෘතදේහය ගෙනගිය දෙමළ ජාතිවාදීහු (ඉහත නම්කෙරුණු අය දෙමළ ජාතිවාදීහු වෙති. දෙමළ ජාතිවාදියකු වීමට දෙමළවීම අවශ්‍ය නො වේ. මෙරට සිංහලත්වයට හිමි තැන අහිමිකිරීමට කටයුතුකරන අය දෙමළ ජාතිවාදීහු වෙති.) එය වෙන්දේසිකර තම ගතමනාව තහවුරුකරගත් පසු මෘතදේහය එතැනම තබා ආපසුගියහ. මෘතදේහය වෙන්දේසිකිරීමෙන් පසුව තමන්ට තවදුරටත් ඒ අයත් නොවන බව ඔවුන්ට පැවසිය හැකි ය. කෙසේහෝ රවිරාජ් මහතාගේ සොවින් පෙළෙන ඥාතීන්ට ම මෘතදේහය ආපසුගෙනයෑමට සිදු වී ඇත. බටහිරයන්ගෙන් නඩත්තුවෙන මෘතදේහය ආපසුගෙනයෑමට ඊනියා මානව හිතවාදය මුදලක් වෙන්කර නොමැති බව පැහැදිලි ය. මානවහිතවාදය ඇත්තේ සිංහලයන්ට ගැරහීමට, චෝදනාකිරීමට මිස මෘතදේහවලට ගරුකිරීමට නො වේ. මේ කුලී මානව හිතවාදීන්ගේ අවමගුල් රැළියේ දී (ඔවුන් එය නම්කර තිබුණේ අවමගුල් රැළිය ලෙස ය!) සිංහල දෙමළ ඉංගිරිසි භාෂා තුනෙන් ම ලියැවුණු ලැජ්ජයි යන වචනය සඳහන් පුවරු සියගණනක් දැකගත හැකි විය.

© Prof. Nalin De Silva

අවමගුල් රැළියේ සංවිධායකයන්ට ඒ වචනය ද පාරාවළල්ලක් විය. පුවරු ඔසවාගත් අය ප්‍රසිද්ධියේ කියා සිටියේ තමන් ඒ අවමගුල් රැළිය පිළිබඳ ලජ්ජාවන බව ය. සැබවින්ම ඔවුන් ඒ පිළිබඳ ලජ්ජා විය යුතු ය. සිංහලයන්ට එරෙහිව කරන ලද මේ සියල්ලෙන් අවමගුල් රැළියේ සංවිධායකයෝ රවිරාජ් මහතාට කළහැකි විශාල ම අගෞරවය කළහ.

රවිරාජ් මහතාගේ දේහය ඒ 9 මාර්ගයෙන් යාපනයට ගෙනයෑමට ඒ මහතාගේ ඥාතීහු ඉල්ලා සිටියහ. ඒ කාගේ වුවමනාවට කළ ඉල්ලීමක්දැයි දැනගැනීමට අංජනම් එළි බැලිය යුතු නො වෙයි. අංජනම් එළියෙන් ඒ කියැවුණ ද, මෙරට සිටින හේතුවාදී මැට්ටන්ගෙන් හා පුස්සන්ගෙන් නම් ඒ දැනගත නොහැකි බව ද මෙහි දී සඳහන්කළ යුතු ය. මේ මස 29 වැනි දා මගේ ලෝකය පිළිබඳ පැවැත්වෙන සම්මන්ත්‍රණයක දී හේතුවාදී පුස්සන්ගේ ද, වෙනත් අයගේ ද හෙළුව දැක්වීමට ද අදහස්කරමි. කෙසේවෙතත් රවිරාජ් මහතාගේ දේහය ඒ 9 මාර්ගයෙන් ගෙනයෑමට අවසර නොදීම පිළිබඳව අපේ ස්තුතිය ආණ්ඩුවට හිමිවිය යුතු ය. තම හිතෛෂී කුලී මානවහිතවාදීන් විහාරමහාදේවී උද්‍යානයෙහි දී වෙන්දේසිකිරීමෙන් පසුව රවිරාජ් මහතාගේ දේහය ඒ 9 මාර්ගයේ වෙන්දේසිකිරීම කොටින්ගේ අභිලාෂය විය. ඒ ඔවුන්ගේ ප්‍රධාන අභිලාෂය වූ ඊළම පිහිටුවීම සඳහා ය. කොටි අද ඒ 9 මාර්ගය ඊළම පිහිටුවීමේ මාර්ගයක් ලෙස යොදාගනිති. රවිරාජ් මහතා ඝාතනයකිරීමට පෙර දිනෙක සිංහල බෞද්ධ විරෝධී චිත්‍රපටි අධ්‍යක්ෂකවරු, විවිධ හේතු නිසා සිංහල සමාජය කෙරෙහි වෛරයෙන් පසුවන ජඩමාධ්‍යවේදීහු, එංගලන්තයට ගොස් ආචාර්ය උපාධිය ලබාගැනීමට නොහැකිව ලංකාවේ දී තම ගුරුවරුන් ඔස්සේ ඒ ලබාගෙන ලුලා නැති වළේ පඩියන් වූ කණයෝ ආදීහු ඒ 9 මාර්ගය විවෘතකරන ලෙස ජනමාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වූහ. ඔවුන්ගේ ද වෑයම ඒ 9 මාර්ගය ඊළමේ මාර්ගය බවට පත්කිරීම ය. මොවුන්ට ආහාර නොමැතියැයි කියන යාපනයේ වැසියන් ගැන මානවහිතවාදයක් පහළ වී ඇත. ආණ්ඩුව යාපනයට යවන භාණ්ඩ නිසි අයුරින් බෙදාහැරීම වළක්වන්නේ කොටි සංවිධානය ය. මානවහිතවාදීන් කළයුත්තේ අඩුතරමින් කිළිනොච්චියට ගොස් වෙළෙන්දන්ට බලපෑම් නොකරන ලෙස කොටින්ට කියා සිටීම ය. එහෙත් ඒ සඳහා ද මානව හිතවාදී ප්‍රතිපාදන අවශ්‍ය වෙයි. ඒ ප්‍රතිපාදන බටහිරයෝ නො දෙති. බටහිරයන්ගේ ප්‍රතිපාදන සිංහල විරෝධී කටයුතු සඳහා පමණ ය.

අවනගුල් රැළියට හෙවත් රවිරාජ් මහතාගේ දේහ වෙන්දේසියට සහභාගීවූවන් අතර අඩුම තරමින් ශ්‍රී ල නි පක්ෂයේ එක් නියෝජ්‍ය ඇමතිවරයෙක් හා රනිල් විරෝධී එ ජා ප පිළේ සාමාජිකයෙක් ද වූහ. මොවුන් දෙදෙනා ම කලකට ඉහත මහජන පක්ෂයේ සාමාජිකයන් වූ බව අපට අමතක නො වේ. ඉන් එක් අයකු කුමාර් රූපසිංහගේ ජනවේග කල්ලියේ සිටි බව ද මතක ය. අවමගුල් රැළියේ කැපී පෙනෙන සංවිධායකයා ලෙස ක්‍රියා කෙළේ ද මේ රූපසිංහ ය. ජනවේගය හා මහජන පක්ෂය යන දෙකම බණ්ඩාරනායකවරුන්ගේ එක්කලෙක බෑණාවරුන් විසින් සංවිධානය කෙරිණි. ඔවුන්ට බෞද්ධ නොවන සම්භවයක් හා අඩුම එරමින් රෝස පැහැති මාක්ස්වාදී සමාජවාදයක් විය. දෙමළ ජාතිවාදයට පක්ෂව එක්වන සිංහලයන්ගෙන් ඉතා වැඩි පිරිස එක්කෝ අබෞද්ධයන්, නැත්නම් අනුකාරක මාක්ස්වාදී ඇංකරයන්, එසේත් නැත්නම් ඊනියා ලිබරල්වාදී ධනේශ්වරය වෙනුවෙන් පෙනී සිටින්නන් වීමේ රහස කුමක් ද? ඊනියා අධිනිශ්චය ද? අද ජාතිවාදය අධිනිශ්චය වී ඇතැයි අනුකාරක මාක්ස්වාදී ගිරා පෝතකයන් අල්තුසර්ගේ බංකොළොත් සංකල්පයක් අල්ලාගෙන කෑගසන්නේ ඒ කසිකබල් සංකල්පය ලංකාවට හඳුන්වාදුන්නේ යැයි කියන තවත් කණයකු ලුලකු කරමිනි. අල්තුසර්ගේ බංකොළොත් සංකල්පය වුව ද අද ලංකාවේ ඇංකරයන් යොදාගන්නා සංකල්පය තරම් බංකොළොත් නැති බව කිවයුතු ය. අනුකාරකයන් අධිනිශ්චය ලෙස වැරදියට පරිවර්තනය කරඇත්තේ අල්තුසර්ගේ ඕවර්ඩිටර්මින්ඩ් යන්න ය. එය අධිනිර්ණිත ලෙස පරිවර්තනය විය යුතු ය. අනුකාරකයෝ අධිනිශ්චය යන්න අධිවිනිශ්චය යන අරුතෙන් ද වහරති. බටහිර භෞතික විද්‍යාවේ අල්තුරස්ගේ වැනි සංකල්පයක් ඉදිරිපත්කෙරිණි නම් ඒ ගැරඬි හැවක් මෙන් කෙවිටකින් ගෙන විසිකෙරෙනු ඇත. සිංහල විරෝධීන් එකතුකෙරෙන්නේ විජාතික බලවේගය ලෙස ය. ඒ පිටුපස ඇත්තේ බටහිර විජාතික බලවේගය ය. අප කොතෙකුත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ යටත්විජිතවාදය ගැන සඳහන්කර ඇතත් සිංහල බහුතරය තවමත් ඒ වටහාගෙන ඇති බවක් නො පෙනෙයි. රවිරාජ් මහතාගේ දේහය වෙන්දේසිකරනුලැබුයේ මේ දේශීය වශයෙන් ක්‍රියාකරන විජාතික බලවේගය විසිනි. ඔවුන් පිටුපස විදේශීය විජාතික බලවේග වෙයි. මේ බලවේග හඳුනානොගෙන අපට දෙමළ ජාතිවාදය පරාජය කළනොහැකි ය. ඇත්තේ ත්‍රස්තවාදයක් යැයි කියමින් ප්‍රශ්නයේ මුලට යෑමට සිංහලයන් දක්වන අකමැත්ත සිංහලයන්ට හානිදායක ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva